සැ. යු. — 2015.04.24 දින පළ වූ අංක 1,912 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,913 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 762 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ විසිතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

761- B 80944— 5,302 (2015/04)
F 1 -

# පළාත් සභා නිවේදන

**මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉඩමක් සොහොන් බිමක් වශයෙන් පවත්වාගෙන යාම සුසාන භූමි සහ සොහොන් බිම් ආඥාපනතේ 34 වැනි වගන්තිය යටතේ නවතාලීම**

දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් පාවිච්චි කිරීමේ දී සහ ඉටු කිරීමේ දී නිසි බලධාරී මාතර මහා නගර සභාවේ සහ මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ නිර්දේශය මත මෙහි පහත I වැනි උපලේඛනයේ සඳහන් බලයලත් මිනින්දෝරු හෙන්රි අබේසිංහ මහතා විසින් 2011.05.20 දින සකස් කරන ලද අංක 28/2011 දරන සැලැස්මෙහි ඊ/1 යනුවෙන් දක්වා ඇති බිම් කැබැල්ල සොහොන් බිමක් වශයෙන් භාවිතය සහ පවත්වාගෙන යෑම සුසාන භූමි සහ සොහොන් බිම් ආඥාපනතේ 34 වැනි වගන්තිය යටතේ නවතාලනු ලැබේ.

ඒ අනුව මෙහි පහත උපලේඛන අංක I හි විස්තර සඳහන් එකී ඉඩම සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි නවතාලීමට නියෝග කරමි.

මෙම ඉඩම සම්බන්ධයෙන් 1940.01.12 වැනි දින අංක 8567 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පලකර ඇති නිවේදනය ද වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලබන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය,
නීතිය හා සාමය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,
පළාත් පාලන, ප්‍රවාහන සහ සංචාරක අමාත්‍ය.

2015 මාර්තු මස 18 වැනි දින,
දක්ෂිනපාය, ලබුදූව,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

උපලේඛනය I

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඩවත් සතර කොට්ඨාසයේ, මාතර මහා නගර සභා සීමාව තුළ පිහිටි මහපැලවත්ත හෙවත් ඉඟිනිගහවත්ත නැමැති ඉඩමෙහි, බලයලත් මිනින්දෝරු හෙන්රි අබේසිංහ මහතා විසින් සකස් කරන ලද අංක 21/2011 සහ 2011.05.20 දිනැති සැලැස්මේ පර්චස් 30.5 බිම් ප්‍රමාණයකින් යුත් පහත සඳහන් මායිම් තුල පිහිටි අංක ඊ/1 දරන බෙදා වෙන් කල ඉඩම.

ඉඩමට මායිම්,

*උතුරට* - එම ඉඩමේ 'ඩී' අක්ෂරය දරන බිම් කැබැල්ල,
*නැගෙනහිරට* - ඊ/2 දරන බිම් කැබැල්ල සහ අබේගුණරතන මාවත,
*දකුණට* - එම ඉඩමේ 'එෆ්' අක්ෂරය දරන බිම් කැබැල්ල,
*බටහිරට* - අනගාරික ධර්මපාල මාවත.

04-882/1

---

**මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉඩමක් සුසාන භූමි සහ සොහොන් බිම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ සුසාන භූමියක් වශයෙන් හැඳින්වීම**

සුසාන භූමි සහ සොහොන් බිම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා විසින් නිසි බලධාරී මාතර මහා නගර සභාවේ සහ මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය මත මෙහි පහත II වැනි උපලේඛනයේ සඳහන් ඊ/2 දරන ඉඩම මුදලිඳු එන්. ඒ. වික්‍රමසූරිය, ඔහුගේ පවුලේ අය සහ ඔවුන්ගෙන් පැවත එන්නන්ගේ පවුලේ සුසාන භූමියක් වශයෙන් සුසාන භූමි හා සොහොන් බිම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ අනුමත කරමි.

ඒ අනුව පහත II වැනි උපලේඛනයේ සඳහන් එකී ඉඩම පවුලක සුසාන භූමියක් වශයෙන් පවත්වාගෙන යනු ලබන බව මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

ගුස්තිඥ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය,
නීතිය හා සාමය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,
පළාත් පාලන, ප්‍රවාහන සහ සංචාරක අමාත්‍ය.

2015 මාර්තු මස 18 වැනි දින,
දක්ෂිනපාය, ලබුදූව,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

උපලේඛනය II

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඩවත් සතර කොට්ඨාසයේ, මාතර මහා නගර සභා සීමාව තුළ පිහිටි මහපැලවත්ත හෙවත් ඉඟිනිගහවත්ත නැමැති ඉඩමෙහි, 'ඊ' අක්ෂරය දරන බිම් කැබැල්ලෙහි බලයලත් මිනින්දෝරු හෙන්රි අබේසිංහ මහතා විසින් 2011.05.20 වැනි දින සකස් කරන ලද අංක 21/2011 දරන මිනුම් සැලැස්ම අනුව පහත මායිම් තුල පිහිටි පර්චස් 0.5ක බිම් ප්‍රමාණයකින් යුත් අංක ඊ/2 දරන බෙදා වෙන් කල ඉඩම.

ඉඩමට මායිම්,

*උතුරට* - එම ඉඩමේ 'ඩී' අක්ෂරය දරන බිම් කැබැල්ල,
*නැගෙනහිරට* - අබේගුණරතන මාවත,
*දකුණට* - අංක ඊ/1 දරන බිම් කැබැල්ල,
*බටහිරට* - අංක ඊ/1 දරන බිම් කැබැල්ල.

04-882/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.